اللهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنْ زَوَالِ نِعْمَتِكَ، وَتَحَوُّلِ عَافِيَتِكَ، وَفُجَاءَةِ نِقْمَتِكَ، وَجَمِيعِ سَخَطِكَ (අහෝ් දෙවිඳුනි ! ඔබේ ආශිර්වාදයන් ඉවත්ව යාමෙන් ද ඔබේ සුවය වෙනතකට පෙරළීමෙන් ද ඔබේ දඬුවම අනපේක්ෂිතව පැමිණීමෙන් ද ඔබේ සියලු කෝපයන්ගෙන් ද ආරක්ෂාව මම ඔබෙන්ම පතමි.)

අබ්දුල්ලා ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) මෙසේ ප්‍රාර්ථනා කරන්නෙක් වූහ: اللهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنْ زَوَالِ نِعْمَتِكَ، وَتَحَوُّلِ عَافِيَتِكَ، وَفُجَاءَةِ نِقْمَتِكَ، وَجَمِيعِ سَخَطِكَ (අහෝ් දෙවිඳුනි! ඔබේ ආශිර්වාදයන් ඉවත්ව යාමෙන් ද ඔබේ සුවය වෙනතකට පෙරළීමෙන් ද ඔබේ දඬුවම අනපේක්ෂිතව පැමිණීමෙන් ද ඔබේ සියලු කෝපයන්ගෙන් ද ආරක්ෂාව මම ඔබෙන්ම පතමි.)

[صحيح] [رواه مسلم]

කරුණු හතරක් සම්බන්ධව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ආරක්ෂාව පැතූහ: පළමුව: اللهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنْ زَوَالِ نِعْمَتِكَ (අහෝ් දෙවිඳුනි! ඔබේ ආශිර්වාදයන් ඉවත්ව යාමෙන් ආරක්ෂාව මම ඔබෙන් පතමි) එනම් මෙලොව හා මතුලොව ආශිර්වාදයන් අහිමි වීමෙන් ආරක්ෂාවය . එමෙන්ම ඉස්ලාමය මත ස්ථාවරත්වය ද, ආශිර්වාද අහිමි කරන පාපකම්වල වැටීමෙන් දුරස් කරන මෙන් ද ඉල්ලා සිටිමි. وَتَحَـــوُّلِ عَافِيَتِـــكَ (ඔබ වෙතින් වූ සුවය වෙනතකට පෙරළීමෙන් ද) එය පරීක්ෂණයක් දක්වා පරිවර්තනය වීමෙන් ද ආරක්ෂාව පතමි. සදා සුවය මෙන්ම සියලුම දුක් වේදනාවන් හා ලෙඩ රෝගවලින් සුවය මම ඔබෙන් පතමි. තුන්වැන්න: وَفُجَـاءَةِ نِقْمَتِـكَ (ඔබේ දඬුවම අනපේක්ෂිතව පැමිණීමෙන් ද ආරක්ෂාව පතමි) එනම් පරීක්ෂණ හා ව්‍යසන ඇතිවීමෙන් ආරක්ෂාව පතමි. දඬුවම් හා දුක් කරදර අනපෙක්ෂිත ලෙස එකවර ඇති වූ විටෙක පාපක්ෂමාවෙහි නිරත වීමට හෝ එය සහනයක් ලබා ගැනීමට හෝ කාලයක් නැත. එමගින් ඇතිවන අර්බුධය බිහිසුණුය. අති මහත්ය. සිව්වැන්න: وَجَمِيعِ سَخَطِكَ (ඔබේ සියලු කෝපයන්ගෙන් ද) ඔබේ කෝපයට තුඩු දෙන හේතු සාධකවලින් ද මම ඔබෙන් ආරක්ෂාව පතමි. ඔබ කවරෙකු කෙරෙහි කෝප වූයේ ද සැබැවින්ම ඔහු පරාජය අත් කර ගත් අතර පාඩු ලැබුවේය. සුවිශුද්ධ අල්ලාහ්ගේ කෝපයට හේතුවන සියලුම ප්‍රකාශ, ක්‍රියාවන් හා විශ්වාසයන් ඇතුළත් වන පරිදි මෙම වචන එකතුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ගෙන ආහ.

http://www.sunnah.global/hadeeth/si/show/5488